**ශීර්ෂය - 329 - තොරතුරු තාක්ෂණ කළමණාකරණ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1. 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අග්‍රිම ගැලපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමට අදාල රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයට අනුව අග්‍රිම ගැලපුම් ගිණුම සකස් කිරීමේ දී ගැළපීම් නොකළ යුතු රු. 203,600 ක වටිනාකමක් අග්‍රිම ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. | රු. 203,660/- ක මුදල නිවැරදිව ගිණුම් ගත කර ඇති අතර දෙපාර්තමේන්තු පොත් අනුවද එම ශේෂය නිරවුල් කර ඇත. ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ මුද්‍රිත පිටපත් ලබා ගැනීමේදී නිරවුල් නොකළ ශේෂයක් පවතින බව දක්නට ලැබුනත් 2021 වර්ෂය සඳහා පවත්වා ගෙන යනු ලබන **Cigas** වැඩ සටහනේ එවැනි ආරම්භක ශේෂයක් දක්නට නොලැබේ. එබැවින් එය නිවැරදි නොවන **Cigas** පරිගණක වැඩ සටහනින් ගන්නා ලද මුද්‍රිත පිටපතක් හේතුවෙන් සිදු වී ඇති දෝෂයක් වන අතර මින් ඉදිරියට සැලකිලිමත්ව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී.<br>රු.203,660/- ක මුදල අග්‍රිම ගිණුමට ගැලපීම නිවැරදි වන අතර ලැබිය යුතු අග්‍රිම ගිණුමට ගැලපීමක් නොකළ යුතු බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ දුරකථනය මගින් කළ විමසීමේදී දන්වා සිටින ලදී. එමෙන්ම අග්‍රිම ගැලපීම් ගිණුමට ඇතුළත් කළ යුතු සියළුම අයිතමයන් 20/2020 මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කර නොමැති බවද එම දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | ගිණුම් සකස් කිරීමේදී මාර්ගෝපදේශ අනුගමනය කිරීමේ අවශ්‍යතාවය |

**1.6.2 මූල්‍ය නොවන වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා ඇති පරිගණක මෘදුකාංගවල ආරම්භක ශේෂය රු.879,281 ක් වුවද, එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි රු.1,479,281 ක් ලෙස දැක්වීම හේතුවෙන් අස්පෘශ්‍ය වත්කම් රු.600,000කින් වැඩියෙන් දක්වා තිබුණි. | පරිගණක මෘදුකාංග ගිණුම්ගත කරනු ලැබුයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වන අතර 2019 වර්ෂයේ ශේෂය රු. 600,000 ක් අඩුවෙන් 2020 වර්ෂයේ ගිණුම්ගත කර ඇත. එම වෙනස 2021 මාර්තු මස නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වියයුතු වීම. භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව ගිණුම් සැසඳීම් කර නිවැරදි වටිනාකම් පවත්වා ගැනීම |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම රු. 1,953,919 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු. 1,838,211 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු. 115,708 ක වෙනසක් නිරීක්ෂණය විය. | රු. 115,708.00 ක මුදල වැරදීමකින් දෙවරක් සටහන් වීම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අඩුවෙන් පෙන්වා ඇත. දල පදනම මත යනුවෙන් මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් වුවද මුදල් පදනම මත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම ගැටළුවක් නොවන බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවසන ලදී. | නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදයන් හා මාර්ගෝපදේශ අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 2,305,173 ක් හා රු. 2,375,764 ක් ලෙස දක්වා තිබුණු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම් රු. 3,275,317 ක් හා රු. 2,583,363 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි රු. 762,545 ක් වැඩියෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සතුව ඇති වාර්තා අනුව අත්තිකාරම් “බී” ගිණුමේ ණය අය කිරීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ණය අය කිරීම් අතර වෙනසක් නිරීක්ෂණය නොවන අතර අත්තිකාරම් ගෙවීම්හි දෙපාර්තමේන්තුව වෙත පැමිණි නිලධාරියෙකුගේ ණය ශේෂ මාරු කිරීම් රු. 210,099 ක් සිදු නොකිරීම හා රු. 2,500 ක වැඩිපුර ණය වාරික අය කිරීමක් සිදු වී ඇත. එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වලට අදාල මුදල් ප්‍රවාහයන් ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම. |

## 1.6.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් වල රු.164,126 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස්කම් මේ වන විට නිවැරදි කර ඇති අතර ඉදිරියේදී මෙවැනි මහ හැරීම් නොකිරීමට අදාළ නිලධාරීන්ට හට උපදෙස් ලබා දී ඇත. | අත්තිකාරම් ‘බී’ ගිණුම්වල ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදුකිරීමට කටයුතු කිරීම |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|
| දෙපාර්තමේන්තුව 2020 වර්ෂය තුලදී රු. මිලියන 763 ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණු අතර මහා භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණු අග්‍රිමය රු. මිලියන 406 ක් පමණක් විය. ඒ අනුව ඉල්ලුම් කරන ලද මුදලින් සියයට 53 ක අග්‍රිම ප්‍රමාණයක් පමණක් මහා භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට නිකුත් කර තිබුණි. | 2020 වර්ෂයේ පැවතියේ අතුරු සම්මත අය වැයක් වන අතර, එහි පළමු අය වැය ජනවාරි, පෙබරවාරි, මාර්තු හා අප්‍රේල් මාසයට අදාළ විය. ඊට අදාළව අග්‍රිම ඉල්ලුම් කිරීම සැලසුම් කර තිබුණු අතර, ඉන් පසුව රටේ පැවති **Covid - 19** වසංගත තත්ත්වය හේතුවෙන් පසු මාසයන්ට අදාළ අග්‍රිම ඉල්ලුම් කිරීම සඳහා සැලසුම් සැකසීමට නොහැකි විය. අයවැය ප්‍රතිපාදනය මත **Free Balance** සහ **Enable** ආයතනයන්හි (**ITMIS** වැඩ සටහන සඳහා) කාර්තු ගෙවීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇති මුත් **Enable** ආයතනයේ බිල්පත් වටිනාකම අඩු වීම හේතුවෙන් ගෙවීම් කල යුතු මුදල අඩුවීම සහ **ITMIS** පරිගණක වැඩ සටහන ඇතුලත් කරන ලද ගෙවීම් කල යුතු මුදල අඩුවීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් මෙම අග්‍රිම ලබාදීම අඩුවීම මෙම තත්ත්වය ඇති වී ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂය තුල පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු. 2,250,000 ක් වූ ප්‍රතිපාදනය මු.රෙ. 66 යටතේ සියයට 6 සිට සියයට 46 දක්වා අඩුකිරීම්ද, වැය විෂයයන් 03 ක එකතුව රු.820,000 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 19 සිට සියයට 59 ක් දක්වා වැඩි කිරීම්ද සිදුකර තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |
| (ආ) මූලධන වැය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 .යටතේ සියයට 100 ක අඩු කිරීමක් හා සියයට 217 ක වැඩි කිරීමක් සිදුකර තිබුණි. | Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මූලධන වියදම් වැය විෂය 329-1-1-2401 යටතේ කාර්ය මණ්ඩල පුහුණු කටයුතු (Outbound Training Programme) සඳහා | වාර්ෂික ඇස්තමේන්තු තාත්විකව හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| | | ඇස්තමේන්තු කළ වියදම් 2020 වසර තුළ සිදු නොවීය. මුදල් අමාත්‍යාංශ ලේකම් කාර්යාලය වෙත රාජකාරි අවශ්‍යතාවය සඳහා ලැප්ටොප් පරිගණකයක් හා දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිගණක උපාංග මිලදී ගැනීමට සිදුවීම හා පැවති වසංගත තත්ත්වයට මුහුණදීම සඳහා නිලධාරීන්ගේ සුභසාධනයට අදාළ උපකරණ මිළදී ගැනීම සඳහා වැය විෂයය 329-1-1-2103 යටතේ ඇස්තමේන්තු කළ මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මු.රෙ. 66 යටතේ මාරු කිරීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 07 ක් සඳහා රු.421,269,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.56,087,784 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 68 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | **Covid 19** වසංගත තත්ත්වය මත 2020 වසරේ අවසාන කාර්තුවේ දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කල පරිදි සිදු නොවීම හේතුවෙන් ද, **ITMIS** පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා තෝරා ගත් සමාගම වෙත ඇස්තමේන්තු කළ මුදලට වඩා 2020 වසරේ නඩත්තු වියදම සෑම කාර්තුවකම සියයට 30 කින් පමණ අඩුවීම නිසා සමස්ථ වියදම අඩු වීම හේතුවෙන්ද, **ITMIS** ව්‍යාපෘතිය බාහිර ආයතන කරා ගෙන යාමට සැලසුම් කර තිබූ නමුත් **(Roll Out) Covid - 19** තත්ත්වය යටතේ එම සැලසුම සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන්ද සහ වෙළඳපල සීමාවීම මත ගෘහ භාණ්ඩ හා උපකරණ වෙළඳපල තුළ නොමැතිවීම නිසා සැලසුම් කළ අයුරින් මිළදී ගැනීම් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන්ද වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු විය. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධිප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම |

## 2.3 බැරකම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ භාණ්ඩාගාර පොත් අනුව රු. 18,771,838 ක බැරකම් (නිරවුල් නොවූ) ශේෂයක් නිරූපණය වන අතර, මෙම ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කර නොතිබුණි. | නිරීක්ෂණයන්හි දක්වා ඇත්තේ 2019 වර්ෂයේ සිදු වූ බැරකම් වන අතර එය 2020 වර්ෂයේ නිරවුල් කර ඇත. Cigas පරිගණක වැඩ සටහනට දත්ත ඇතුළත් කිරීමේදී එම බැරකම මඟ හැරී ඇති අතර එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. එබැවින් එය 2020 ගිණුම් වර්ෂයේ ගිණුම් සඳහා අදාළ නොවන අයිතමයකි. | බැරකම් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කලයුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| <u>විගණන නිරීක්ෂණය</u> | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) මු.රෙ. 392 (ආ) (ii) | පෞද්ගලික පොදු සමාගමක් වෙත ගෙවීම් කරන ලද එකතුව රු. 11,900 ක් වටිනා චෙක්පත් 02 ක් අස්ථානගත වී ඇති බවට සමාගම කළ ඉල්ලීමට අනුව අංක 584926 දරණ චෙක්පතකින් නැවත රු. 11,900 ක් ගෙවීම් කළද අදාල චෙක්පත් 03 ම 2020 ජූලි 07 හා 30 දිනයන්හි උපලබ්ද්ධි වී ඇති බව නිරීක්ෂණය විය. | Covid – 19 වසංගත තත්ත්වය හේතුවෙන් සියළුම නිලධාරීන් රාජකාරි සඳහා ගෙන්වා ගත නොහැකි වූ අතර විවිධ නිලධාරීන් විසින් කාර්යාල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එදිනෙදා කළයුතු සෑම රාජකාරියක්ම ඉටුකර ඇති බැවින් විෂය දැනුමෙන් තොරව කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි ගැටළු ඇති වී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) මු.රෙ. 880 | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | ඇප තැන්පත් තැබීම සඳහා අදාළ වන නීත්‍යානුකූල පසුබිම සොයා බලා නිසි උපදෙස් ලබා ගෙන ඉදිරියේදී ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කිරීම |
| (ඇ) මු.රෙ. 756 හා අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය | ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාල පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කලයුතු වුවද, 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ හා යෝජනා සම්බන්ධයෙන් 2021 මැයි 06 වූ විගණිත දින වන විටත් අදාළ කටයුතු අවසන් කර නොතිබුණි. | 2021.03.17 දින අපහරණ කමිටුවක් පත් කර ඇති අතර, Covid - 19 තත්ත්වය හේතුවෙන් නිලධාරින් සේවයට කැඳවීම කඩින් කඩ සිදු වන බැවින් එම කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.<br>එම කටයුතු කඩිනමින් අවසන් කරන මෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැටුප් ගෙවීම් පද්ධතිය පුළුල් කිරීමේ අරමුණින් ඊ වැටුප් පද්ධතිය හඳුන්වා දී තිබුණු අතර, මූලිකව හඳුනාගත් දෙපාර්තමේන්තු අටෙහි හා ඉතිරි දෙපාර්තමේන්තු හයෙහි එම අරමුණ සියයට 70 ක් දක්වා පමණක් ලඟාකරගෙන තිබුණි. | e-Payroll වැටුප් ගෙවීම් පද්ධතිය මූලිකව හඳුනාගත් දෙපාර්තමේන්තු අටෙහි කටයුතු 2020 දෙසැම්බර් මස 31 වන දින වන විට සියයට 85 කින් අවසන්ව තිබූ අතර, ඉතිරි දෙපාර්තමේන්තු හයෙහි සියයට 70 ක සාර්ථකත්වයක් ළඟා කර ගෙන තිබුණි. පද්ධතිය ක්‍රියාත්මක වීමේදී හඳුනාගත් නව අවශ්‍යතා සහ ගැටලු සකසා ගැනීමට තවදුරටත් කාලය අවශ්‍ය වූ බැවින් සහ රටේ උද්ගත වූ Covid -19 තත්ත්වය හේතුවෙන් පද්ධතිය භාවිතා කරන්නන් සහභාගී කරවා ගැනීමේදී ඇති වූ දුෂ්කරතා හේතුවෙන් Live run ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවානුව තුල සම්පූර්ණ කලයුතු වීමේ අවශ්‍යතාවය |
| (ආ) | ආනයන/ අපනයන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක තනි කවුළු මෘදුකාංගය ක්‍රියාවට නැංවීමට අදාළව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සඳහා වන පද්ධතියේ සංවර්ධන කටයුතු සියයට 70 ක් දක්වා සම්පූර්ණ කර තිබුණි. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සඳහා වන මෘදුකාංග පද්ධතියේ සංවර්ධන කටයුතු 70% අවසන්ව ඇත. ආනයන අපනයන ක්‍රියාවලිය සඳහා පොදුවේ සම්බන්ධ වන රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛත්වයෙන් යුතුව Single Window වැඩ සටහන ඉදිරියට ගෙන යාමට කටයුතු කර ඇති අතර, මේ සම්බන්ධව භාණ්ඩාගාර ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් විසින් අධීක්ෂණය සිදු කෙරේ. | -එම- |
| (ඇ) | රජයේ නිලධාරීන්ට තීරු බදු රහිතව වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතිය සංවර්ධනය කොට මෙතෙක් ක්‍රියාත්මක කර නොපැවතුණි | වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතියේ මුල් අවස්ථාවේදී හඳුනාගත් අවශ්‍යතාවලට අමතර TIPD වෙතින් නව අවශ්‍යතා අප වෙත ලබා දුන් අතර ඒ අනුව පද්ධතිය සංවර්ධනය කරමින් පවතී. | -එම- |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව ඇතුළත් කර යාවත්කාලීන කල යුතු වුවද, 2021 මැයි 10 දින වනවිට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පමණක් එහි ඇතුළත් කර තිබූ බව නිරීක්ෂණය විය. | අදාළ තොරතුරු ඇතුළත් කරමින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | වෙබ් අඩවිය නිසිපරිදි යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | --------------------- | ------------------------------------ | ----------- |
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2019 වර්ෂයේ සිට පුරප්පාඩු තත්ත්වයේ පවතින අතර, රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දැනුම් දී තිබුණද, විගණිත දිනය වූ 2021 මැයි 05 වනවිටත් මෙම තනතුර නිත්‍ය පදනමින් පිරවී නොතිබුණි. | 2020.12.31 දිනට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II/III ශ්‍රේණියේ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතියත්, ඉන් එකක් සඳහා දැනටමත් නිලධාරියකු ස්ථාන මාරුව පැමිණ ඇත. අනෙක් තනතුර සඳහාද නිලධාරියෙකු තෝරා ගෙන ස්ථාන මාරු කර එවන ලෙස දන්වා යවා ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | තෘතියික මට්ටමේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර 2020 ඔක්තෝබර් මස සිට පුරප්පාඩුව පැවතුණි. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අයත් වන බැවින්, එම පුරප්පාඩුව සම්පූර්ණ කර දෙන ලෙස රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කර ඇත. | -එම- |